JMC vLearning
"your virtual learning partner"

# ව්‍යවසායකත්වයේ දායකත්වය

## AAT අදියර I

## BEN - ව්‍යාපාර පරිසරය


තරංග ජයනන්ද
B.Sc. (Business Administration) Sp. (USJP)



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

JMC vLearning

“your virtual learning partner”

# ව්‍යවසායකත්වයේ දායකත්වය

තරංග ජයනන්ද

## ව්‍යවසායකත්වය

ව්‍යවසායකත්වය (Entrepreneurship) ප්‍රංශ භාෂාවේ ඇති Entreprendre යන වචනයෙන් බිඳී ආ පදයකි. එම වචනයෙන් කියැවෙන විවිධ අර්ථයන් අතර,

1.අවස්ථා හඹා යාම

2.බාර ගැනීම

3.නව්‍යතා සම්පාදනය මඟින් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම

4.නව නිර්මාණ යනාදිය වේ.




මේ අනුව රටක පවතින අර්ථ ක්‍රමය වෙනස් කිරීම සඳහා අවදානම් බාර ගැනීම, නව නිර්මාණ බිහි කිරීම, ජාතික නිෂ්පාදිතයට වැඩි වටිනාකමක් එකතු කිරීම, නව ව්‍යාපාර අවස්ථා ග්‍රහණය කර ගැනීම හා මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමේ කාර්යයයේ නියැලීම පුළුල් ක්‍රියාවලියක් ව්‍යවසායකත්වයට අයත් ය.

©JMC vLearning

## ව්‍යවසායකත්වයට ලබා දී ඇති විවිධ නිර්වචන

නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීමෙන් හෝ නව සංවිධාන ක්‍රම නිර්මාණය කිරීමෙන් හෝ නව අමුද්‍රව්‍ය භාවිතා කිරීමෙන් හෝ පවත්නා අර්ථක්‍රමය වෙනස් කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වයයි.
- ජෝශප් පීටර් -

ප්‍රාග්ධනය හා ශ්‍රමය අතර අතරමැදියෙකු ලෙස කටයුතු කිරීම ව්‍යවසායකත්වයයි.
- ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය -

අවිනිශ්චිතතාවලට මුහුණදීම ව්‍යවසායකත්වයයි.
- රිචර්ඩ් කැන්ටිනට් -

©JMC vLearning

නව ව්‍යාපාරයක් දියත් කොට සාර්ථකව පවත්වාගෙන යාමට ඇති හැකියාව ව්‍යවසායකත්වයයි.
- අන්තර් ජාතික කම්කරු සංවිධානය -

අවස්ථාවක් උදාකරගෙන ඉන් ප්‍රායෝජන ගැනීමට සංවිධානයක් නිර්මාණය කරන්නා ව්‍යවසායකයෙකි. අවස්ථා උදාකරගෙන ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවිධාන නිර්මාණය කිරීමේදී සම්බන්ධ වන සියළු කටයුතු සහ කාර්යය ව්‍යවසායකත්ව ක්‍රියාවලියට ඇතුලත් වේ.
- විලියම් ඩී. බයිග්‍රේව් -

©JMC vLearning

## ව්‍යවසායකයා (Entrepreneur)






කිසියම් ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා නව්‍යතා සම්පාදනය කරන්නා නැතිනම් නව නිෂ්පාදනයක් වෙළඳපොලට හඳුන්වාදෙන්නා, අවදානම් මනා ලෙස කළමනාකරණය කරන්නා, සම්පත් ඒකරාශීකරණය කරන්නා හා ඒවා හැසිරවීම සිදු කරන්නා ව්‍යවසායකයා ලෙස හඳුන්වයි.

©JMC vLearning

## ව්‍යවසායකයා යන්නට ලබා දී ඇති විවිධ නිර්වචන

නව භාණ්ඩ හා සේවා හඳුන්වාදීමෙන් හෝ නව සංවිධාන ක්‍රම නිර්මාණය කිරීමෙන් හෝ නව අමුද්‍රව්‍ය භාවිතා කිරීමෙන් හෝ පවත්නා අර්ථක්‍රමය වෙනස් කරන පුද්ගලයා ව්‍යාවසායකයාය.
- ජෝන් පීටර් -

නව සංවිධානයක් නිර්මාණය කරන පුද්ගලයෙකි.
- වෙස්පර් -

©JMC vLearning

අවස්ථා දැක ණය ඉදිරියටම ගෙනයාම සඳහා සංවිධානය ගොඩනඟන පුද්ගලයා ව්‍යවසායකයා වේ.

- බයිග් රේව් -

වැටුපට වැඩ නොකරන ස්වයංසේවා නියුක්ති පුද්ගලයෙකි.

- රිචර්ඩ් කැන්ටිලන් -

©JMC vLearning

## මේ අනුව ව්‍යවසායකයෝ යනු,

- ගවේෂකයෝය
- විශ්මිත දෑ කරන්නෝය
- අභිමතාර්ථ ඉෂ්ඨකරන්නෝය
- වෙනස්කම් කරන නියෝජිතයෝය
- අවදානම් කළමනාකරණය කරන්නෝය
- නිරන්තර පරිසර විශ්ලේෂණයේ යෙදෙන්නෝය
- තමාගේ ගමන්මඟ හරහා යාමට ප්‍රියකරන්නෝය
- වෙනස්වන ලෝකයට නායකත්වය දිය හැකි පුද්ගලයෝය
- අවශ්‍යතා හා වුවමනා සඳහා යෝග්‍ය අසාමාන්‍ය දෙයක් ගැන සිතන්නෝය.

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## ව්‍යවසායකයෙකු සතුවිය යුතු ගතිලක්ෂණ/නිපුණතා

1. දැක්ම (Vision)
   - යමක් කෙසේ විය යුතුද? එය අනාගතයේ කවර තත්ත්වයකට පත්විය යුතුද යන්න පිළිබඳව ව්‍යවසායකයාට ඇති අවබෝධයයි

2. නිර්මාණශීලීතාවය (Creativity)
   - නිර්මාණශීලීතාවය හෙවත් නව්‍යතා සම්පාදනය ව්‍යවසායකයෙකු සතු වැදගත්කම ගුණාංගයයි. අලුත් විදිහට සිතීමට හා අලුත් යමක් කිරීමට ඇති හැකියාව මින් අදහස් කරයි.

3. ආත්ම විශ්වාසය (Self Confidence)
   - තම අරමුණු ඉටුකර ගැනීම සඳහා තමා තුල ඇති ප්‍රබල ආත්ම විශ්වාසය මත සෘජුව කටයුතු කරයි. පරාජයක් ඇති වුවද කණස්සල්ලට පත් නොවී දැඩි අධිෂ්ඨානයෙන් යුතුව සියල්ලට මුහුණ දී සාර්ථකත්වය කරා මෙහෙයවීමේ හැකියාවයි

©JMC vLearning

4. අවබෝධය (Perceptive)
   - යමක් සිදු වීමට පෙර එය දැකීම හෙවත් ව්‍යාපාර පරිසරයේ වෙනස්වීම් කල්තියා දැකීම අවබෝධය වේ. මින් ඕනෑම අභියෝගයකට මුහුණ දීමට හැකිවන අතර ව්‍යාපාර ප්‍රවණතා හඳුනාගෙන ඒවා ව්‍යාපාර අවස්ථා බවට පත්කර ගැනීමේ හැකියාව ලැබේ

5. නව ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීමේ හැකියාව (Able to Identify New Business Opportunities)
   - ආර්ථික ක්‍රමය කුමක් වුවත් ව්‍යාපාර පරිසරය කොතරම් සංකීර්ණ වුවත් නව ව්‍යාපාරික අවස්ථා අතුරින් සුදුසුම විකල්පය තෝරා ගැනීමට ව්‍යවසායකයා සතු හැකියාවය.

6. අවධානම් කළමනාකරණය කිරීමේ හැකියාව (Able to Manage Risk)
   - ව්‍යවසායකයා සෑමවිටම අවධානම අභියෝගයක් ලෙස සලකන අතර එය ඉතා ක්‍රමානුකූලව කළමනාකරණය කරයි

©JMC vLearning

7. **අභිප්‍රේරණතාව, හෙවත් අභිප්‍රේරණය වී සිටීම** (Motivated)

- සාර්ථකත්වය සඳහා දිගු කාලයක් කැපවී කටයුතු කිරීමට පවතින උනන්දුව, උද්යෝගය නැත්නම් පෙළඹීමයි

අභිප්‍රේරණයක් ඇති වීමට බලපාන සාධක

- ව්‍යාපාරයේ ප්‍රධානියා තමාය යන හැඟීම
- පෞද්ගලික තෘප්තිය
- විවිධත්වයට පවතින පෞද්ගලික නිදහස
- නව අභියෝග වලට මුහුණ දීමට ඇති කැමැත්ත
- තමාගේ දක්‍ෂතා වලින් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම.

8. **තීරණවලට පැමිණීමේ හැකියාව** (Fast Decision Making)

- තීරණ ගැනීම සඳහා විශාල කාලයක් වැය නොකර ඉක්මණින් තීරණ ගැනීමේ හැකියාවය

©JMC vLearning

9. **නිර්මාණශීලීත්වය හා නවෝත්පාදන** (Creativity and Innovation)

- අලුත් අදහසක් ඉදිරිපත් කිරීම නිර්මාණශීලීත්වය වන අතර එය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි තත්ත්වයට පත් කිරීම නවෝත්පාදනයයි

නවෝත්පාදනය යටතට අයත් දෑ:

- නව භාණ්ඩයක් හෝ සේවයක් නිපදවීම
- නව නිෂ්පාදන ක්‍රමයක් හඳුන්වා දීම
- නව වෙළඳපොළකට පිවිසීම
- නව ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් හඳුන්වාදීම
- පවත්නා භාණ්ඩයක ගුණාත්මක වෙනසක් ඇති කිරීම
- හැඩය වෙනස් කිරීම
- නව අංග ලක්‍ෂණ එකතු දීම
- නව මෝස්තර හඳුන්වා දීම
- නව සන්නමක් යෙදීම.

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

10. **කැපවීම** (Considered)

- තම අරමුණු ඉටුවන තෙක්ම මහන්සි නොබලා වැඩ කිරීමේ හැකියාව මින් අදහස් කරයි. ඒ තුලින් ව්‍යවසායකයා ශ්‍රමයට ආදරය කරන හා ගරු කරන පුද්ගලයෙක් බවට පත් වේ

11. **ස්වාධීන බව** (Independence)

- තමා හිතන අයුරු තම අභිමතය පරිදි වැඩ කිරීමට, තීරණ ගැනීමට නිදහස සලකා ගැනීම මින් අදහස් කරයි. අන් අයගේ අදහස් වලට ගරුකර ඒවා දැරීමට ඇති අයිතිය පිළිගනී. ඔහු තමන්ගේ ගමන් මඟ හා ගමනාන්තය තීරණය කරයි පාලනය කරයි

12. **අවබෝධය හෙවත් දුර දක්නා නුවණ** (Perceptive)

- යමක් සිදු වීමට පෙර එය සිදු විය හැකි බව කල් තියා හඳුනා ගැනීමට ඇති හැකියාව හෙවත් හැකියාව හෙවත් ශක්තිය නැතිනම් දුරදක්නා නුවණ මින් අදහස් කරයි. මෙමඟින් අනාගත ප්‍රවණතා සාර්ථක ව්‍යාපාර අවස්ථා බවට පරිවර්තනය කර ගැනීමටද හැකියාව උදා වේ

©JMC vLearning

13. **ප්‍රතිලාභ මුදුන් පමුණුවා ගැනීමේ උවමනාව** (Achievevemend Oriented)

- තම ප්‍රතිලාභයක් ඉටුකර ගැනීම සඳහා ප්‍රබල ආශාවකින් කටයුතු කිරීම මෙහි අදහසයි. එක් ඉලක්කයක් ඉටුකරගත් විට ඊළඟ ඉලක්කය පිහිටුවා ගනිමින් ඔහු ඉදිරියට ගමන් කරයි

14. **සුභවාදී බව** (Optimistic )

- නැහැ, ,බැහැ, නොපවසා ධනාත්මක ආකල්පයෙන් යමක් දෙස බලයි. සෘණ ආකල්ප බැහැර කරයි

15. **නම්‍යශීලී බව** (Flexibility)

- නිතර වෙනස්වන ව්‍යාපාර පරිසරයට අනුව සාර්ථකව හැඩගැසීමට ඇති හැකියාවයි. පරිසරයේ වෙනස්කම් සිදු වන තෙක් බලා නොසිට ඔහු ප්‍රථමයෙන් ක්‍රියා කරන්නෙක් බවට පත්වේ.

©JMC vLearning

## ව්‍යවසායකත්ව කුසලතා

ව්‍යවසායකයකු සතු විය යුතු සහ වර්ධනය කරගත යුතු හැකියා සමූහයක් පවතින අතර ඒවා ව්‍යවාසයකත්ව කුසලතා ලෙස හඳුන්වා දිය හැක

1. නායකත්ව කුසලතා (Leadership Skills)
   - තමාගේ ව්‍යාපාරයේ නායකයා තමාමය. තම අනුගාමිකයන් ලවා කාර්යය ඉටුකරවා ගැනීම සඳහා උනන්දුවක් හා ධෛර්යමත්ව කටයුතු කිරීමට අනුගාමිකයන් යොමු කිරීම හා ඔවුන්ගේ හැසිරීම්වලට බලපෑම් කිරීම මින් පිළිබිඹු කරයි

2. අන්තර් පුද්ගල කුසලතා (Inter Pesonal Skills)
   - අභ්‍යන්තර හා බාහිර පාර්ශව සමඟ ව්‍යාපාර කටයුතු සාර්ථක කර ගැනීම සඳහා මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීමයි. නැතහොත් සියලු පාර්ශවයන් පිළිබඳ අවබෝධයෙන් යුතුව තම කාර්යයන් කෙරෙහි නැඹුරු කර ගැනීමට හැකි ලෙස කටයුතු කිරීමට ඇති හැකියාවයි

©JMC vLearning

3. සන්නිවේදන කුසලතා (Communication Skills)
   - අරමුණු ඉටුකර ගැනීමට හැකිවන සේ තොරතුරු භාවිතා කිරීමට ඇති හැකියාව නැතහොත් තමන් සතු දේ අවබෝධයක් ලැබෙන ආකාරයට අන් අය සතු කිරීමේ ක්‍රියාවලිය මනාව මෙහෙයවීමයි

4. මූලික කළමනාකරණ කුසලතා (Basic Management Skills)
   - සැළසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම හා පාලනය යන මූලික කළමනාකරණ ශ්‍රිතයන් පිළිබඳ කුසලතාවලින් යුක්ත වීමයි.




©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## ව්‍යවසායකයකුගේ කාර්යභාරය

- ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීම හා තම අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීම
- ශ්‍රමය, භූමිය හා ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධක මනා ලෙස හසුරුවමින් නව භාණ්ඩ නිෂ්පාදනය කිරීම
- නිෂ්පාදනවල විවිධ වෙනස්කම් සිදු කිරීම හෙවත් නව්‍යතා සම්පාදනය
- නිෂ්පාදනය කළ හැකි විවිධ විකල්ප ක්‍රම තීරණය කිරීම සහ කොපමණ නිමවුම් ප්‍රමාණයක් සිදු කල යුතුද යන්න තීරණය කිරීම.




©JMC vLearning

## ව්‍යවසායකයා හා කළමනාකරුවා

ව්‍යවසායකයා ව්‍යාපාරය මෙහෙයවයි

නව්‍යතා සම්පාදනය කරයි

අවදානම් වලට මුහුණ දෙමින් ලාභ උපයයි

ව්‍යවසායකයා විසින් ව්‍යාපාරයේ පැවැත්මට අදාල තීරණ ගන්නා අතර සංවිධාන හා පාලන කටයුතු වලට සම්බන්ධ වේ

මේ අනුව ව්‍යවසායකයා නව්‍යතා සම්පාදනයට අමතරව කළමනාකරණ කටයුතු වලද නිරත වේ. එබැවින් සෑම ව්‍යවසායකයෙක්ම කළමනාකරුවෙකි.

නමුත් සෑම කළමනාකරුවෙක්ම නව්‍යතා සම්පාදනය නොකරයි. අවදානමට මුහුණ නොදෙයි. කළමනාකරුවා වැටුපක් සඳහා කටයුතු කරන අතර මේ අනුව සෑම කළමනාකරුවෙක්ම ව්‍යවසායකයෙක් නොවේ.

©JMC vLearning

| ව්‍යවසායකයා | කළමනාකරුවා |
|---|---|
| ව්‍යාපාරයක් ආරම්භ කිරීමට මූලිකව කටයුතු කරයි | ඇරඹූ ව්‍යාපාරය පවත්වාගෙන යයි |
| අවදානම් දරණ ව්‍යවසායකයා ඒ වෙනුවෙන් ලාභ හෝ පාඩු අත් විඳී | කළමනාකරුවා ව්‍යාපාර කටයුතු මනා ලෙස කරගෙන යාමට තම හැකියාව මෙහෙයවයි. ඒ වෙනුවෙන් වැටුප් හා වෙනත් දීමනා ලබා ගනී |
| ව්‍යවසායකයා ව්‍යාපාරයේ අයිතිකරු වේ | කළමනාකරුවා ව්‍යාපාරයේ සේවකයෙකු වේ |
| ව්‍යවසායකයා ව්‍යාපාරය වෙනුවෙන් සමාජයට, රජයට වගකිව යුතු වේ | කළමනාකරුවා තම කටයුතු වෙනුවෙන් අයිතිකරුට වගකිව යුතුය |
| බලය තමන් විසින් නිර්මාණය කර ගනී | තනතුර මත අධිකාරී බලය ලැබේ |
| ව්‍යාපාරික අවස්ථා හඳුනා ගනී | ව්‍යාපාරික ගැටළු හඳුනා ගනී |
| සමාජ ප්‍රතිලාභ කෙරෙහිද සමාජ වගකීම් කෙරෙහිද අවධානය යොමු කරයි | ව්‍යාපාරයේ ප්‍රතිලාභ කෙරෙහි අවධානය යොමු කරයි |

©JMC vLearning

## ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා

ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර වෙනස දැක්වීමේදී පෙනී යන්නේ ව්‍යවසායකයා අනිවාර්යයෙන්ම ව්‍යාපාරිකයකු වුවත් ව්‍යාපාරිකයා අනිවාර්යයෙන්ම ව්‍යාවසායකයකු නොවිය හැකි බවයි




©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| ව්‍යවසායකයා | ව්‍යවසායකයෙකු නොවන ව්‍යාපාරිකයා |
|---|---|
| තමාගේ අදහස් හා නව සංකල්පයන් අනුව ව්‍යාපාරය අරඹයි | පවතින අදහසක් හෝ සංකල්පයක් අනුව ව්‍යාපාරය අරඹයි |
| ව්‍යාපාරික ප්‍රතිවාදියා වන්නේ තමාමය | අනෙකුත් ව්‍යාපාර ප්‍රතිවාදීන් වේ |
| නව ව්‍යාපාරික අවස්ථා කෙරෙහි අවධානය යොමු කරයි | නිතරම තමාගේ ව්‍යාපාර කටයුතුවල නිරත වෙයි |
| නවෝත්පාදකයෙකි | සම්ප්‍රදායිකයෙකි |
| අවදානමට මුහුණ දෙයි | ආරක්ෂාකාරීව කටයුතු කරයි |
| ගැටළු ඇති වූ විට ඒවා පිටු දැකීමට ධෛර්යමත්ව කටයුතු කරයි | ගැටලු මඟහැරී අධෛර්යයට පත් වේ |
| නව ව්‍යාපාරික අවස්ථා දකියි. ප්‍රයෝජන ගනියි | වෙනත් අයෙකු විසින් දකින ලද අවස්ථා භාවිත කරයි |

©JMC vLearning

## ව්‍යවසායකත්වයේ වැදගත්කම







- වර්තමාන ව්‍යාපාර ලෝකයේ පවතින දැඩි තරඟකාරීත්වය හේතුවෙන් ව්‍යාපාරික ලෝකයේ රැඳී සිටීමට නම් අලුත් දේ බිහිකල යුතු වීම හෙවත් නවෝත්පාදනවල අවශ්‍යතාවය
- පවතින සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමට විවධාංගීකරණයෙන් යුත් ව්‍යාපාර ඇති කිරීමේ අවශ්‍යතාව
- වෙනස්වන ලෝකය තුල ගෝලීයකරණය හමුවේ නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් ව්‍යාපාර කටයුතු වෙනස් කරගැනීමේ අවශ්‍යතාව
- වේගවත් ලෙස වෙනස්වන ව්‍යාපාරික පරිසරය තුල සාර්ථකව ව්‍යාපාර කටයුතු මෙහෙයවීමේ අවශ්‍යතාවය

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- නව ව්‍යාපාර හා නව රැකියා නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය
- ජීවන තත්ත්වය උසස් කිරීමට, පුද්ගල ආදායම ඉහල නැංවීම හා උසස් තත්ත්වයේ භාණ්ඩ පරිභෝජනය කිරීමේ අවස්ථාව සපුරාලීමේ අවශ්‍යතාව
- ආර්ථික වර්ධනය වේගවත් කර ගැනීම සඳහා භාණ්ඩ හා සේවා වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමේ අවශ්‍යතාව
- ආර්ථික සංවර්ධනය හා තිරසාර සංවර්ධනයක් උදාකර ගැනීමේ අවශ්‍යතාවය.








©JMC vLearning

## ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර ඇති සම්බන්ධතාවය

- මිනිස් අවශ්‍යතා සඳහා වුවමනා නිර්මාණය කොට ඒවා තෘප්තිමත් කිරීම සඳහා අවදානම් කළමනාකරණය කරමින් නව්‍යතා සම්පාදනය කරනු ලබන සමස්ථ ක්‍රියාවලිය ව්‍යාවසායකත්වය ලෙස හඳුන්වයි. මෙහිදී ව්‍යාවසායකත්වය තුලින් ව්‍යාපාර බිහි වී ඇති බව පෙනේ
- මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම හා අලෙවි කිරීම ව්‍යාපාර ලෙස විග්‍රහ කළ හැකි අතර ඒ සඳහා ව්‍යාපාර අවශ්‍යතා හඳුනා ගැනීම අවදානම් කළමනාකරණය හා නවෝත්පාදනය ව්‍යවසායකත්වය තුලින් ඉටු වේ
- ඇරඹූ ව්‍යාපාර පවත්වාගෙන යාම හා පවත්නා ව්‍යාපාර කටයුතුම සිදු කිරීමට වෙනත් ව්‍යාපාරයක් ආරම්භ කිරීම තුලින් බිහි වන්නේ ව්‍යාපාරයකි
- මේ අනුව ව්‍යාපාර සියල්ල ව්‍යවසායකයන් නොවුවද ව්‍යවසායකත්වයේ අවසාන ප්‍රතිඵලය ව්‍යාපාර ලෙස සැලකිය හැකිය.

©JMC vLearning

## ව්‍යවසායකත්ව ප්‍රතිලාභ

සියළු ව්‍යාපාර බිහි කිරීමට ආරම්භක ශක්තියක් ලබාදෙන ව්‍යවසායකත්වය තුලින් ප්‍රධාන වශයෙන් පුද්ගල, ආයතනික හා සමාජ ආර්ථික ප්‍රතිලාභ රාශියක් අත්පත් කර දෙයි.

### ව්‍යවසායකත්වයේ පුද්ගල ප්‍රතිලාභ

- පුද්ගල හැකියා වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම
- ඉහල කැපවීමක් සිදු කරන්නේ නම් ඉහල ප්‍රතිලාභ ද ලබා ගැනීමට මඟ පෑදීම
- පුද්ගලයාට සමාජයේ පිළිගැනීමක් ඇති වීම
- ඉහළ ජීවන මට්ටමක් ගතකළ හැකි වීම
- පෞද්ගලික මූල්‍යමය හැකියාව හා ප්‍රතිලාභ
- වෙනත් අය අනුගමනය වෙනුවට නායකත්වය ගැනීමට හැකි වීම
- නව නිර්මාණශීලීත්වය ප්‍රදර්ශනය කිරීමට ඇති ඉඩකඩ

©JMC vLearning

- සිය අදහස් ක්‍රියාත්මක කිරීමට අවස්ථාව හිමි වීම
- නිදහස් තීරණ ගැනීමට ඇති හැකියාව
- මානසික තෘප්තිය ඉහළ යාම.



### ව්‍යවසායකත්වයේ ආයතනික ප්‍රතිලාභ

- ව්‍යාපාර කටයුතු පුළුල් කර ගැනීමට අවකාශ බිහි වීම
- තරඟකාරීත්වයට පහසුවෙන් මුහුණ දිය හැකි වීම
- වෙළඳපොළ කොටස පුළුල් කර ගැනීමට හැකි වීම
- ව්‍යාපාරය අඛණ්ඩව පුළුල් කර ගැනීමට හැකි වීම
- සමාජයේ සුරක්ෂිත ආයතනයක් බවට නිරායාසයෙන් පත්වීම
- ලාභදායීත්වය වැඩිකර ගැනීමට ඇති හැකියාව
- සමාජ වගකීම් ඉටු කිරීමට හැකි තෘප්තිමත් ආයතනයක් බවට පත්වීම

©JMC vLearning

- ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම
- කර්මාන්තය තුල විශිෂ්ඨයන් බවට පත්වීම
- රජයේ ඇගයීමට ලක්වීමට හැකිවීම.



### ව්‍යවසායකත්වයේ සමාජ හා ආර්ථික ප්‍රතිලාභ

- නව රැකියා අවස්ථා ජනිත කිරීම
- නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා උදා කිරීම
- ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම
- නව වෙළඳපොලවල් සංවර්ධනය
- ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යාම
- ආර්ථික වෘද්ධියක් ඇති වීම
- ජාතික නිෂ්පාදිතය ඉහළ යාම

©JMC vLearning

- තිරසාර ආර්ථික සංවර්ධනයට මඟ පෑදීම
- නිෂ්පාදනවල ගුණාත්වය වර්ධනය වීම
- සාධාරණ තරඟකාරීත්වයක් නිර්මාණය වීම.



## ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය

රටක කොතරම් භෞතික හා මානව සම්පත් පැවතියද ආර්ථික සංවර්ධනය යන්ත්‍රයක් ලෙස සැලකුවහොත් එම යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉන්ධන ලෙස ව්‍යවසායකත්වය සැලකිය හැක

මේ අනුව ආර්ථික සංවර්ධනය හා ව්‍යවසායකත්වය එක්ව ගමන් කරන විට රටක් සංවර්ධන මාවතට යොමු වීම හා සංවර්ධිත රටක් බවට අත්වීමට ඇති හැකියාව ඉහල අගයක් ගනී.

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## ආර්ථික සංවර්ධනයට ව්‍යවසායකත්වයේ දායකත්වය


- වෙළඳපොල ආර්ථිකය තුල ඒකාධිකාරී තත්ත්වයක් බිහිවීම පිටු දැකීම සඳහා තරඟකාරීත්වය දියුණු කිරීම හා කාර්යක්ෂමතාව වර්ධනය තුලින් භාණ්ඩ මිල අඩු කිරීමට හැකි වීම
- නව නිෂ්පාදන බිහිවීම තුලින් වෙළඳපොල ප්‍රසාරණය වීම
- රටේ සම්පත් ඵලදායී නිෂ්පාදන අංශවලට යොමු කිරීමට හැකිවීම
- ශ්‍රම සූක්ෂම නිෂ්පාදන අවස්ථා බිහි කිරීම
- විරැකියාව අවම වීමට හේතු වීම
- රජයේ ආර්ථික ප්‍රත්පත්ති යටතේ බිහිවන සුළු පරිමාණ කර්මාන්තවල පැවැත්ම තහවුරු කිරීම
- අඩු ප්‍රාග්ධන අවශ්‍යතා ඇති ව්‍යාපාරික කටයුතු ප්‍රවර්ධන කිරීම
- දේශීය තාක්ෂණය යොදාගත හැකි නිෂ්පාදන අංශ බිහි කිරීම
- මහා පරිමාණ නිෂ්පාදනයන්ට අවශ්‍ය නිෂ්පාදනයන් බිහි කිරීම
- ආර්ථික සංවර්ධනයට මූලික වීම.

©JMC vLearning

## ව්‍යවසායකත්වයේ ප්‍රවණතා

1. අභ්‍යන්තර ව්‍යවසායකත්වය (Intra Entrepreneurship)

ව්‍යාපාර සංවිධානවල සේවකයන් නිර්මාණශීලීත්වය තුලින් බිහි කෙරෙන ව්‍යවසායකත්වයයි
ආයතනයේ සේවකයන් නව නිපැයුම් කරා රැගෙන යාමට ව්‍යාපාර සංවිධානයේ ඉහළ කළමනාකරුවන් අවධානය යොමු කළ අතර සේවකයන් දිරිමත් කරමින් නිර්මාණාත්මක අදහස් ලබා ගැනීම නව නිර්මාණ ඇගයීම, ත්‍යාග පිරිනැමීම, උසස්වීම් ලබාදීම ආදිය සිදුකල යුතුය



©JMC vLearning

## 2. සමාජීය ව්‍යවසායකත්වය (Social Entrepreneurship)

සමාජයට මෙහෙවරක් කිරීමේ අරමුණින් නව්‍යතා සම්පාදනයේ යෙදීමයි
ලාභය හෝ ධනය ඉපයීම අරමුණු කර නොගෙන සමාජයීය වටිනාකම් හා සාරධර්ම පෝෂණය කිරීම, පරිසර සංරක්ෂණය, සෞඛ්‍යමය සේවා, පරෝපකාරය හා ආපදා යනාදී ක්ෂේත්‍රයන්හි මෙම ව්‍යවසායකත්ව ප්‍රවණතාවන් ඉස්මතු වේ
පෞද්ගලිකව ඇති කරගත හැක මානසික තෘප්තිය, පිළිගැනීම, ප්‍රශංසාව යනාදී ප්‍රතිලාභ මෙමගින් ලැබිය හැක



©JMC vLearning

## 3. හරිත ව්‍යවසායකත්වය (Green Entrepreneurship)

පාරිසරික ගැටළු සමාජයීය ගැටළු හෝ අවශ්‍යතා සඳහා ඉතා ඉහළ අවධානයක් යොමු කරමින් ස්වාභාවික පරිසරයට ධනාත්මක බලපෑමක් ඇති කිරීමට අදාල ව්‍යවසායකත්ව ක්‍රියාකාරකම් හරිත ව්‍යවසායකත්වය මගින් සිදු කෙරේ
පරිසරය සුරැකීමේ අරමුණින් පරිසර ගැටළු වලට සංවේදී වෙමින් තම ව්‍යවසායකත්වය මෙයෙහවයි



©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### 4. ගෝලීය ව්‍යවසායකත්වය (Global Entrepreneurship)

ලෝකයටම තම නිෂ්පාදිත ලබාදීම සඳහා වෙළඳාමේ යෙදීම මින් අදහස් කරයි

ලෝකයේ කුමන ස්ථානයක සිටිය ද තාක්ෂණික මෙවලම් භාවිතයෙන් දේශසීමා මායිම් වලින් බැහැරව සංනිවේදන ජාලය විහිදා තම නිෂ්පාදනය වෙනස් විය යුතුද යන්න අවබෝධ කර ගනිමින් ඒ අනුව තම නිෂ්පාදනය වෙනස්කම් වලට භාජනය වෙමින් ලොව පුරා වෙළඳාම් කිරීමට හැකිවන ලෙස කටයුතු කිරීම වේ

ගෝලීය ව්‍යවසායකත්වය තුලින් ගුණාත්වයෙන් යුතු භාණ්ඩ, හොඳ තෝරා ගැනීමකින් යුතුව භාවිතා කිරීමටත්, වටිනාකමෙන් ඉහළ භාණ්ඩ හා සේවා පරිභෝජනයට ලැබීමෙන් ජීවන තත්ත්වය උසස් කර ගැනීමට ගෝලීය ව්‍යවසායකයන්ගේ සිය නිෂ්පාදන පරිභෝජනයෙන් විවිධ රටවල ජනතාවට අවස්ථාව සැලසේ

©JMC vLearning

### 5. කාන්තා ව්‍යවසායකත්වය (Women Entrepreneurship)

ශ්‍රී ලංකාවේ කාන්තාවන් ව්‍යාපාර කටයුතු කෙරෙහි නැඹුරු වීමක් ඇති බව පසුගිය දශකය තුල සිට දක්නට ලැබෙන ප්‍රවණතාවයකි. මෙය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හිතකර ලක්ෂණයක් ලෙස දැක්විය හැක.



කාන්තා ව්‍යවසායකත්වය ඉහළ යාමට බලපෑ හේතු

- කාන්තාවන් තුළ අධ්‍යාපන මට්ටම දියුණු වීම
- ශ්‍රම බලකාය තුල කාන්තා නියෝජනය ඉහළ යාම
- සමාජයීය ආකල්පවල ඇති වූ වෙනස්කම් (කාන්තාවන් වෘත්තියක නියැලීම)

©JMC vLearning

- කාන්තාවගේ දායකත්වය අවශ්‍ය වන ව්‍යාපාර ක්ෂේත්‍රවල ඇති වූ වර්ධනය
- පවුලේ ආදායම් ඉහළ නැංවීමේ අවශ්‍යතාව පැන නැගීම
- දැඩි අරපිරිමැස්මෙන් කටයුතු කිරීමට සිදු වීම.

කාන්තා ව්‍යවසායකත්වය මුහුණු දෙන අභියෝග

- නිවසේ කටයුතු සඳහා වැඩි කාලයක් යෙදවීමට සිදු වීම
- ඇතැම් ජන කොටස් තුල පවතින එදිරිවාදී ආකල්ප
- පහසුකම් සපයන ආයතන තුළ කාන්තාවන්ට ඇති අඩු පිළිගැනීම
- ඇතැම් රටවල නීතිරීති මඟින් ඇති කරන පීඩනය
- රජයේ දිරිගැන්වීම් ප්‍රමාණවත් නොවීම
- පුරුෂාධිපත්‍ය සංකල්පය මුල් බැසගෙන තිබීම.

©JMC vLearning

JMC vLearning "your virtual learning"